**25-08-2025** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, පියවරක් පියවරක් පාසා, කුමක් සිදුවුවත්, සිදුවන්නේ යහපතකි. මෙම නාටකයේ, පරමාත්ම පියාගේ ස්මරණයේ සිටින්නන් වැඩියෙන්ම යහපත අත්විඳියි.

**ප්‍රශ්නය:** නාටකයේ නියම වී ඇති කිනම් රහස දැනගැනීමෙන්ද, දරුවන් තුළ අනන්ත සතුට පවත්වාගත හැක්කේ?

**පිළිතුර:** නාටකයට අනුව මෙම පැරණි ලොව දැන් විනාශ වීමට යන බව දන්නා අයට අනන්ත සතුටක් පවත්වා ගත හැක. ස්වභාවික ව්‍යසනද ඇති වෙයි. කෙසේවෙතත්, ඔබගේ රාජධානිය ස්ථාපනය වීමට යන අතර කිසිවෙකුට එය වැලැක්විය නොහැක. ඔය දරුවන්ගේ තත්ත්වය අස්ථාවර වෙයි; ඇතැම් විටෙක ඔබට බොහෝ උද්යෝගය ඇති අතර තවත් විටෙක ඔබ උදාසීන වෙයි. කෙසේවෙතත්, ඔබ ඒ පිළිබඳව අවුලක් ඇති කර නොගත යුතුයි. පරමාත්ම දෙවියන්, සෑම ජීවාත්මයකගේම පියා, ඔබට උගන්වනවාය, යන සතුට පවත්වා ගන්න.

**ගීතය:** ප්‍රීතිමත් එකමුතුව තුළ සළඹයන් වෙනුවෙන් දැල්ල ඇවිලී ඇත...

ඕම් ශාන්ති. උත්සාහයන් අනුව අංක පිළිවෙලට සිටිනා ඔය ඉතාමත් සුමිහිරි ජීවමාන සළඹයන්ව බාබා සෙනෙහසින් සිහිපත් කරයි. ඔබ සෑම කෙනෙක්ම ජීවමාන සළඹයෙකි. පියාට දැල්ල යැයි කියන මුත් කිසිවෙකු ඔහුව කිසිසේත් නොදනී. දැල්ල විශාල නැත. ඔහු නිකම් තිතකි. ජීවය තිතක් බවත්, ජීවය තුළ මුළු කොටසක්ම පටිගත වී ඇති බවත් කිසි කෙනෙකුගේ බුද්ධිය තුළට ඇතුළු වන්නේ නැත. ජීවය සහ උත්තරීතර ජීවය පිළිබඳ දැනුම වෙන කිසිවෙකුගේ බුද්ධිය තුළ නොමැත. පියා පැමිණ ඔය දරුවන්ට විස්තර කර දී ඇත. ජීවය පිළිබඳ අවබෝධය ඔහු ඔබට ලබා දී ඇත. පෙර කල ජීවය හෝ උත්තරීතර ජීවය යනු කවරෙක්ද කියා ඔබ දැන සිටියේ නැත. එබැවින්, ඔවුන්ගේ ශරීර අවධානය නිසා දරුවන්ට බොහෝ බැඳීම් සහ දුර්ගුණ රාශියක් ද තිබේ. භාරතය බොහෝ ශ්‍රේෂ්ඨ විය. දුර්ගුණ පිළිබඳ සඳහනක්වත් එහි නොවීය. එය දුර්ගුණ වලින් තොර වූ භාරතයයි. එය දැන් දුෂ්ඨ භාරතයයි. පියා ඔබට විස්තර කරන ආකාරයට, කිසිම මනුෂ්‍යයෙකුට ඔබට මෙය කිව නොහැක. මම මෙම දේශය වසර 5000 කට පෙර ශිවාලය බවට පත් කළෙමි. මම ම ශිවාලය ස්ථාපනය කළෙමි. කෙසේද? ඔබට මෙය දැන් වැටහෙයි. පියවරක් පියවරක් පාසා, කුමක් සිදුවුවද එය යහපත් බව ඔබ දනී. පියාව ඉතා හොඳින් සිහිපත් කොට තමන්ට යහපතක් සිදුකර ගන්නා අයට සෑම දිනයක්ම එන්න එන්නම යහපත් වෙයි. ඔබ ශ්‍රේෂ්ඨතම ජීවයන් බවට පත්වන යහපත් යුගය මෙයයි. පියාගේ ප්‍රශංසාව බොහෝය. සත්‍ය භගවතය දැන් රඟදැක්වෙන බව ඔබ දනී. තඹ යුගයේදී භක්ති මාර්ගය මුලින්ම ආරම්භ වන විට, දියමන්ති වලින් ඕවලාකාර ප්‍රතිරූපයක් නිර්මාණය කොට එයට වන්දනාමාන කිරීම පළමුවෙන්ම ආරම්භ කළේ ඔබයි. ඔබ වන්දනා කරන්නන් ව සිටි කළ, ඔබ දේවාල තැනූ බව ඔබට දැන් සිහිපත් වෙයි. ඔබ ඒවා දියමන්ති සහ මැණික් වලින් තැනුවේය. එම ප්‍රතිරූප දැන් ලබා ගත නොහැක. මෙහි මිනිසුන් එම ප්‍රතිරූපම වන්දනාමාන කිරීම සඳහා රිදියෙන් තනයි. බලන්න එවැනි වන්දනාකරුවන්ට කෙතරම් ගෞරවයක් තිබේද කියා. සෑම කෙනෙක්ම ශිවාට වන්දනාමාන පැවැත් වුවත්, එය අමිශ්‍ර වන්දනාව නොවෙයි. විනාශය අනිවාර්යෙන්ම සිදුවීමට යන බව ඔය දරුවන්ද දනී. ඒ සඳහා දැන් සියල්ල සූදානම් වෙමින් පවතී. ස්වභාවික ව්‍යසනද නාටකයේ නියම වී තිබේ. කෙනෙක් ඒ ගැන කෙතරම් තම හිස කලබල කර ගත්තත්, ඔබගේ රාජධානිය අනිවාර්යෙන්ම ස්ථාපනය වීමට යයි. මේ ගැන කිසි දෙයක් කිරීමට කිසිවෙකුට බලයක් නොමැත. කෙසේවෙතත්, ඔය ජීවයන්ගේ තත්ත්වය චංචල වෙයි. මෙය විශාල ආදායමකි. විටෙකදී, ඔබ සතුටින් සිටින නිසා ඔබට ඉතා හොඳ සිතිවිලි ඇති වේ එනමුත් තවත් විටෙක ඔබ ඉතා උදාසීන වෙයි. වන්දනා ගමනකදී වුවද චංචල වීම් ඇති වෙයි, මෙහිදී ද එය එසේමය. විටෙක දී ඔබ අළුයම අවදි වූ විට පියා සිහිපත් කිරීමෙන් බොහෝ සතුට ඇති වෙයි අහා, බාබා අපට උගන්වයි! එය මහත් ආශ්චර්යකි! දෙවියන්, සෑම ජීවයකගේම පියා අපට උගන්වයි! ඔවුන් ක්‍රිෂ්ණා දෙවියන් බව විශ්වාස කරයි. මුළු ලොව පුරාම, ගීතාවට බොහෝ ගෞරවයක් දක්වන්නේ එහි 'දෙවියන් කතා කරයි' යැයි කියා තිබෙන නිසායි. කෙසේවෙතත්, දෙවියන් යනු කවුරුන්දැයි කිසිවෙකු නොදනී. කොතරම් උසස් තත්ත්වයක් උගතුන්ට සහ පණ්ඩිතයන්ට තිබුණත්, ඔවුන් දෙව් පියාව සිහිපත් කරන බව කීවත්, ඔහු පැමිණෙන්නේ කවදාද සහ ඔහු පැමිණි විට කරන්නේ කුමක්ද කියා ඔවුන්ට අමතක වී ඇත. මේ සියලු දෙයක්ම දිගින් දිගටම පියා ඔබට විස්තර කරයි. මේ සෑම දෙයක්ම

නාටකයේ නියමය වී ඇත. මේ රාවණ් ගේ රාජධානිය නැවත වතාවක් ඇති වන අතර අපට නැවත වතාවක් එයට ඇතුළු වීමට සිදුවෙයි. උපරිම, අවිද්‍යා අන්ධකාරය නම් වූ නිද්‍රාවට ඔබව පත් කරන්නේ රාවණ්ය. එය තුළින් විමුක්තිය ලැබෙන, දැනුම, ඔබට ලබා දෙන්නේ එකම එක දැනුමේ සාගරය පමණයි. පියා හැර අන් කිසිවෙකුට ඔබට විමුක්තිය ලබා දිය නොහැක. සැමට විමුක්තිය ලබා දෙන්නේ එකම එක්කෙනෙක් පමණයි. පියා ඔබට ලබා දුන් ගීතාවේ දැනුම අතුරුදහන් වී ඇත. මෙම දැනුම චිරාත්කාලයක සිට පැවත එනවා නොවේ. කුරානය, බයිබලය ආදිය පැවතෙයි (එම ආගමේ කාලයේ සිට) ඒවා විනාශ නොවෙයි. සදාකාලික වී, දිගටම පවතින ග්‍රන්ථයක්, මා ඔබට ලබා දෙන දැනුමින් නිර්මාණය වන්නේ නැත. ඔබ මෙය ලියාගෙන, ඉන්පසු එය විනාශ කරයි. මේ සියල්ලක්ම පිළිස්සී ස්වභාවිකව අවසන් වෙයි. පියා මෙය ඔබට චක්‍රයකට පෙර ද කීවේය, දැනුත් ඔහු ඔබට මෙය කියයි. මෙම දැනුම ඔබ දැන් ලබා ගන්නා අතර, ඉන්පසු ඔබ ත්‍යාගය ලබයි. එබැවින් එහිදී මෙම දැනුම අවශ්‍ය වන්නේ නැත. භක්ති මාර්ගයේ සැම ආගමික ග්‍රන්ථයක්ම ඇත. බාබා ඔබට මෙම දැනුම කියන්නේ ගීතාව කියවා නොවේ. ඔහු ඔබට රාජයෝගාවේ ඉගැන්වීම ලබා දෙයි. ඔවුන් භක්ති මාර්ගයේදී, මෙයින් ආගමික ග්‍රන්ථ නිර්මාණය කොට සියල්ලම පටලවා ගනී. එබැවින් ඔබ විස්තර කළ යුතු ප්‍රධානතම කරුණ වන්නේ ගීතාවේ දැනුම ලබා දුන්නේ කවුරුන් විසින්ද? ඔවුන් එම කෙනාගේ නම වෙනුවට වෙනත් නමක් යොදා ගෙන ඇත. වෙන කිසිවෙකුගේ නමක් වෙනුවට, වෙනත් නමක් යොදාගෙන නැත. අනිත් සැම ආගමකටම ඔවුන්ගේ ප්‍රධාන ආගමික ග්‍රන්ථය තිබේ. ප්‍රධානතම ආගම් වන්නේ දේවතා ධර්මය, ඉස්ලාම් සහ බෞද්ධාගමයි. පළමුව බුද්ධාගම තිබී පසුව ඉස්ලාම් ආගම ඇති වුණු බව සමහරු කියයි. ඔවුන්ට කියන්න එවැනි දේ ගීතාව සමඟ සම්බනධ නොවන බව. අපි සැලකිළිමත් වන්නේ පියාගෙන් අපගේ උරුමය හිමි කර ගැනීමට පමණයි. මෙය විශාල ගසක් බව පියා ඉතා පැහැදිලිව විස්තර කර දෙයි. එය ඉතා හොඳයි එය මල් පෝච්චියක් වැනිය. එයින් නාල තුනක් පැන නගී. වෘක්ෂය බොහෝ පැහැදිලි වැටහීමකින් නිර්මාණය කර ඇත. ඕනෑම කෙනෙකුට ඉතා ඉක්මණින්ම තමා අයත් වන්නේ කුමන ආගමකටද සහ එම ආගම ස්ථාපනය කළේ කවුරුන්ද කියා වටහා ගත හැක. දයානන්ද සහ ඕරබින්දු ගෝස්, හිඳ, මෑතක දී පිටව ගියේය. ඔවුන්ද යෝගා ආදිය ඉගැන්වූ නමුත් ඒ සියල්ල භක්තියයි. දැනුමේ නාමයක් හෝ සළකුණක්වත් නොමැත. ඔවුන්ට ඉතා විශාල නම්බු නාම ලබා දී ඇත! ඒ සැම දෙයක්ම නාටකයේ නියම වී තිබේ. එය නැවත වරක් වසර 5000 කට පසුව සිදු වෙයි. චක්‍රය මුල සිටම නොකඩවා භ්‍රමණය වන අන්දම සහ එය නැවත වරක් එම අන්දමටම සිදුවන අයුරු ඔබ දන්නවා. මෙම වර්තමාන කාලය, අතීතය වී, එය ඉන්පසු අනාගතය වෙයි. අතීතය, වර්තමානය සහ අනාගතය යැයි කියැවේ. අතීතයේ කුමක් වුවත් ඉන්පසු අනාගතය බවට පත් වෙයි. මෙම කාලයේදී ඔබ දැනුම ලබා ගන්නා අතර ඉන්පසු ඔබගේ රාජධානිය හිමිකර ගනී. එය දේවතාවරුන්ගේ රාජධානිය විය. එකළ වෙනින් කිසිම රාජධානියක් නොවීය. මේ සැම දෙයක්ම කතන්දරයක ආකාරයෙන් ඔවුන්ට කියන්න. එය ඉතාමත් ලස්සන කතාවක් වෙයි. ඈත ඈත අතීතයේ, වසර 5000 කට පෙර, භාරතයේ ස්වර්ණමය යුගය විය. එකළ දේවතාවරුන්ගේ රාජධානිය හැරුණු කොට, වෙනත් ආගම් තිබුණේ නැත. එයට සූර්ය වංශික රාජධානිය යැයි කීවේය. වසර 1250 කට එය ලක්ෂ්මි සහ නාරායන් ගේ රාජධානිය වීය. ඉන්පසු ඔවුන් ගේ රාජධානිය තම සහෝදරයන් වන ක්ෂත්‍රියන්ට පැවරූ පසු එම අයගේ රාජධානිය පැවතුණේය. පියා පැමිණ ඔබට ඉගැන්වූ බව, ඔබට විස්තර කළ හැක. හොඳින් ඉගෙන ගත් අය සූර්ය වංශයේ කොටසක් විය. අසමත් වූ අය ක්ෂත්‍රියන් ලෙස නම් කරන ලදි. කෙසේවෙතත්, යුද්ධයක් ආදිය පිළිබඳ ප්‍රශ්නයක් නොවීය. බාබා පවසන්නේ දරුවනේ, මා මෙනෙහි කිරීමෙන් ඔබගේ පාපයන් දුරු වෙයි. ඔබ දුර්ගුණ පරාජය කළ යුතුයි. පියා මෙම ආඥාව නිකුත් කර ඇත රාගය ජය ගන්නා අය ලොව ජය ගන්නා අය බවට පත් වෙයි. පසුව, චක්‍රයෙන් භාගයකට පසුව, ඔවුන් පාපයේ මඟට වැටෙයි. ඔවුන්ගේ පිළිරූ ඇත එහි මුහුණුවර දේවතාවරුන්ගේය. රාමාගේ රාජධානිය සහ රාවණ්ගේ රාජධානිය සම සමව පවතී. මේ පිළිබඳව කතන්දරයක් නිර්මාණය කොට, ඉන්පසු වූයේ කුමක්ද සහ එයිනුත් පසුව සිදුවූයේ කුමක්දැයි විස්තර කරන්න. මෙය සත්‍ය නාරායන් පිළිබඳ කතන්දරයයි. සත්‍යය වන්නේ එකම එක පියා පමණයි. ඔහු දැන් ඔබට මුල, මැද සහ අවසානය පිළිබඳ දැනුම ලබා දෙයි. වෙනින් කිසිවෙකුට මෙම දැනුම ඔබට ලබා දිය නොහැක. මනුෂ්‍යයින් පියාව හඳුනන්නේවත් නැත. ඔවුන්, නළුවන් වන නාටකයේ, නිර්මාණකරු සහ අධ්‍යක්ෂකවරයාව නොදන්නේ නම්, වෙන කවුරුන්ද එය දන්නේ? පියා ඔබට දැන් විස්තර කර දෙන්නේ, මේ සැම දෙයක්ම නාටකයට අනුව, එම අන්දමටම සිදුවෙයි. පියා ඔබට ඉගැන් වීමට නැවත වරක් පැමිණෙයි. වෙනින් කිසිවෙකුට මෙහි පැමිණිය නොහැක. පියා පවසන්නේ මා උගන්වන්නේ ඔය දරුවන්ට පමණයි. අළුත් මනුෂ්‍යයින්ට මෙහි අසුන්ගත නොහැක. ඉන්ද්‍රප්‍රස්ත්හි කතන්දරය ඇත. ඒ ඒ සුරදූතිකාවන්ට වෙන් වුණු නම් තිබේ. ඔබ අතරේ සමහරෙක් දියමන්ති මෙනි. සැම කෙනෙක්ම ඒ පිළිබඳව සිතන්නට පටන් ගත් අයුරින්,

බලන්න රමේශ් ප්‍රදර්ශනය නිර්මාණය කළ අන්දම! එබැවින් ඔහු දියමන්ති මෙන් වටිනා දෙයක් කළේය. සමහරෙක් එක් වර්ගයක මාණික්‍යයක් වන අතර තවත් කෙනෙක් තව වර්ගයක එකකි. සමහරෙක් කිසිම දෙයක් දන්නේ නැත! රාජධානියක් ස්ථාපනය වෙමින් පවතින බව ඔබ දනී. එහි රජවරුන්, රාජිනියන් ඒ සෑම කෙනෙක්ම අවශ්‍යයි. ඔය බ්‍රාහ්මිණ්වරුන් ශ්‍රීමත් අනුගමනය කිරීමෙන් ඉගෙන ගන්නා බවත් ඉන්පසුව ඔබ ලොවට අධිපතියන් වන බවත් ඔබ දනී. ඔබට බොහෝ සතුට තිබිය යුතුයි! මෙම මරණයේ දේශය දැන් විනාශ වීමට යයි. ඔහු ගොස් බිළිඳෙකු වීමට යන බව, මේ කාලයේදීත් මෙම බාබාට වැටහෙයි. එම ළදරු වියේ දේවල් ඔහු ඉදිරියට දැන් පැමිණෙන නිසා, ඔහුගේ මුළු හැසිරීමම වෙනස් වෙයි. ඒ අයුරින්ම, එහිදී ඔවුන් මහළු වන විට, ඔවුන්ගේ පරණ ශරීර හළා දමා, ළදරු තත්ත්වයට යන බව ඔවුන්ට වැටහෙයි. ළදරු විය සතෝපධ්‍රාන් තත්ත්වයයි. ලක්ෂ්මි සහ නාරායන් වැඩිමහල් අයගේ තත්ත්වයයි. ඔවුන් විවාහ වන විට, ඔවුන් සිටින්නේ තම වැඩිමහල් වියේ නොවේ. වැඩිමහල් තත්ත්වය රජෝ තත්ත්වය ලෙසත්, මහළු තත්ත්වය තමෝ තත්ත්වය ලෙසත් හැඳින්වෙයි. මේ නිසයි ක්‍රිෂ්ණාට වැඩිපුර ආදරය දක්වන්නේ. ලක්ෂ්මි සහ නාරායන් එම අයම වුවත් මිනිසුන් මෙම දේවල් නොදනී. ක්‍රිෂ්ණාව තඹ යුගයේ පෙන්වා ඇති අතර, ලක්ෂ්මි සහ නාරායන් ස්වර්ණමය යුගයේ පෙන්වා ඇත. ඔබ දැන් දෙවි දේවතාවන් වීමට උත්සාහ දරමින් සිටියි. පියා පවසන්නේ කුමාරින් බොහෝ ක්‍රියාශීලී විය යුතුයි. කුමාරින් සහ අර්ධ කුමාරීන් වෙනුවෙන් දේවාල ඇත. දිල්වාලා දේවාලය ගොඩනැංවූ ජයිනවරුන්, එම නම එයට දුන්නේ මන්ද කියා නොදනී. එය ඔබගේ නිවැරදි සිහිවටනය බව ඔබට දැන් වැටහෙයි. එය අජීවී වන අතර ජීවමාන එක මෙයයි. අපි මෙහි ජීවමාන ස්වරූපයෙන් අසුන් ගෙන සිටියි. අප භාරතය දිව්‍ය ලෝකය බවට පත් කරවමින් සිටියි. දිව්‍ය ලෝකය මෙහි තිබෙයි. ඔය දරුවන්, අශාරීරික ලෝකය තිබෙන්නේ කොහිද, සූක්ෂම දේශය තිබෙන්නේ කොහිද යන සෑම දෙයක්ම දනී. ඔබ මුළු නාටකයම දනී. අතීතය බවට පත්වී ඇති ඕනෑම දෙයක් ඉන්පසු අනාගතය බවට පත්වී පසුව අතීතය වෙයි. ඔබට උගන්වන්නේ කවුරුන්ද කියා ඔබ වටහා ගත යුතුයි. දෙවියන් අපට උගන්වයි! ඔබ බොහෝ සෙයින් නිවුණු සහ සන්සුන් කෙනෙක් විය යුතුයි. සතුටින් පියාගේ ස්මරණයේ සිටීමෙන් සෑම අවුලක්ම ඉවත්වෙයි. බාබා අපගේ පියායි. ඔහු අපට උගන්වා, ඉන්පසු ඔහුත් සමඟ ආපසු නිවහනට අපව රැගෙන යයි. තමන් ජීවයක් යැයි සළකා, පියාට, උත්තරීතර ජීවයට මෙසේ කතා කරන්න බාබා, මට දැන් වැටහෙයි. මට බ්‍රහ්මා සහ විෂ්ණු පිළිබඳවත් වැටහෙයි. බ්‍රහ්මා, විෂ්ණුගේ පෙකනි වැලෙන් මතු විය. විෂ්ණුව කිරි සාගරයක සහ බ්‍රහ්මාව සූක්ෂම දේශයේ පෙන්වා ඇත. ඇත්ත වශයෙන්ම ඔහු සිටින්නේ මෙහිය. පාලනය කරන්නේ විෂ්ණුයි. බ්‍රහ්මා, විෂ්ණුගෙන් හටගත්තේ නම් ඔහුද අනිවාර්යෙන්ම පාලනය කළ යුතුයි. ඔහු විෂ්ණුගේ පෙකනි වැලෙන් මතු වුණේ නම් එය දරුවෙක් වෙනවා වගේය. පියා මෙතැන අසුන් ගෙන මේ සෑම දෙයක්ම විස්තර කර දෙයි. බ්‍රහ්මා ඔහුගේ උපත් 84 සම්පූර්ණ කොට ඉන්පසු විෂ්ණුගේ දේශයේ අධිපති වෙයි. සමහරුන්ට මෙම දේවල් හොඳින් නොවැටහෙයි, එබැවින් ඔවුන්ගේ සතුටේ රසදිය ඉහළ නොනඟී. ඔබලා ගෝප් සහ ගෝපීන්ය. ඔවුන් ස්වර්ණමය යුගයේ වෙසෙන්නේ නැත. එහිදී ඔබ කුමර කුමරියන් බවට පත්වෙයි. ගෝප් සහ ගෝපිනියන් ගේ පියා ගෝපි වල්ලබ්ය. සෑම කෙනෙකුගේම පියා ප්‍රජාපිතා බ්‍රහ්මා වන අතර, සෑම ජීවයකගේම පියා අශාරීරික ශිවාය. ඔබ සෑම කෙනෙක්ම මුඛයෙන් උපන් නිර්මාණයි. බ්‍රහ්ම කුමර, කුමාරියන් සෑම කෙනෙක්ම සහෝදර සහෝදරියන්ය. කිසිම සාපරාධී ඊර්ෂ්‍යාවක් නොතිබිය යුතුයි මායා ඔබව පරාජය කරන්නේ මෙහිදීය. පියා පවසන්නේ ඔබ මෙතෙක් ඉගෙන ගත් සෑම දෙයක්ම ඔබගේ බුද්ධියෙන් ඉවත් කර ගන්න. මා ඔබට උගන්වන දේවල් ඉගෙන ගන්න. ඉනිමගේ පිංතූරය පළමුවන පෙළේ එකකි. සෑම දෙයක්ම එක දෙයක් මත රඳා පවතී ගීතාවේ දෙවියන් කවුද? ක්‍රිෂ්ණාට දෙවියන් යැයි කිව නොහැක. ඔහු සියලු ගුණ ධර්ම වලින් සපිරුණු දේවතාවරයෙකි. ඔහුගේ නම ගීතාවේ සඳහන් කර ඇත. ඔහු තද නිල් පාටින් පිළිඹිමු කොට ඇත, ලක්ෂ්මි සහ නාරායන් ද තද නිල් පැහැයෙන් පිළිඹිමු කොට ඇත. ඔවුන්ට මෙය පැහැදිලි කළ නොහැක. ඔවුන් රාමචන්ද්‍රවද තද නිල් පැහැයෙන් පිළිඹිමු කොට ඇත. පියා පවසන්නේ ඔහු එසේ වූයේ රාගයේ ගින්න මත අසුන් ගැනීමෙනුයි. එක් අයෙකුගේ නම පමණක් සඳහන් වුවද එය සෑම කෙනෙකුටම බලපවත්වයි. ඔබ සෑම කෙනෙක්ම බ්‍රාහ්මිණ්වරයෙක්ය. ඔබ දැන් දැනුමේ ගින්න මත අසුන් ගෙන සිටියි. ශුද්‍රයන් රාගයේ ගින්න මත අසුන් ගනී. පියා පවසන්නේ දැනුමේ සාගරය කළඹා, අන් අයව අවදි කරවීමේ ක්‍රම නිර්මාණය කරන්න. ඔවුන් සැබවින්ම නාටකයට අනුව අවදි වෙයි. නාටකය ඉතාම, ඉතාම සෙමෙන් ගමන් කරයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට

නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ඔබ ගෝපි වල්ලාබ්ට අයත් ගෝප් සහ ගෝපීන් බව සෑම විටම අවධානයේ තබා ගන්න. මෙම අවධානය තබා ගැනීමෙන් ඔබගේ සතුටෙහි රසඳිය සෑම විටෙකම නැඟී තිබෙයි.
2. ඔබ මෙතෙක් ඉගෙන ගෙන ඇති සෑම දෙයක්ම තම බුද්ධියෙන් ඉවත් කර, පියා ඔබට කියන දේවල් දැන් ඉගෙන ගන්න. සහෝදර සහෝදරියන් වීමේ අවධානය ඇති කර, සාපරාදී ඇස අවසන් කරන්න. මායාට පරාජය නොවන්න.

**වරදානය:** ඔබ ආධ්‍යාත්මික සේවාධාරියෙකු වී සේවය කරන අතරතුර යෝග්‍යුක්ත මනෝ ස්ථිතිය අත්විඳිත්වා.

බ්‍රහ්මණ ජීවිතය යනු සේවා ජීවිතයකි. මායාවෙන් ආරක්ෂිතව සිටීමට ඇති උසස් මාර්ගය සේවය කිරීමයි. සේවය කිරීම ඔබව යෝග්‍යුක්ත කරවයි, නමුත් වචන වලින් සේවය කිරීමෙන් පමණක් නොවේ. ඔබට ඇසෙන මිහිරි වදන් වල ප්‍රතිමූර්තියක් වීමෙන් සේවය කිරීම, පරාර්ථකාමී සේවය කිරීම, ඔබේ අත්හැරීම තුළින් සහ තපසයා ප්‍රතිමූර්තියක් වීමෙන් සේවය කිරීම, සීමිත ආශාවන් ඉක්මවා ගොස් පරාර්ථකාමී සේවය කිරීම: මෙය දේවමය හෝ ආධ්‍යාත්මික සේවය ලෙස හැඳින් වේ. ඔබේ මනසින් මෙන්ම මුඛයෙන් ද සේවය කිරීම යනු "මන්මනභාව්" ස්ථිතියේ ස්ථාවර වීමයි.

**පාඨය:** **අව්‍යක්ත සංඥාව: සහජ යෝගීවරයෙක් වීම සඳහා, පරමාත්ම දෙවියන්ගේ සෙනෙහසේ අත්දැකීම් ලබන්න.**

***** ඕම් ශාන්ති *****

බාප්දාදාට ඔබ දරුවන් කෙරෙහි බොහෝ සෙනෙහසක් ඇති බැවින්, ඔහුගේ සෑම දරුවෙකුම තමාට වඩා ඉදිරියෙන් යා යුතු යැයි ඔහුට හැඟේ. ලෝකයේ ද, ඔබ වඩාත්ම සෙනෙහස දක්වන කෙනා කවුද, ඔබ එම කෙනාව ඔබට වඩා ඉදිරියෙන් යාමට සලස්වයි. මෙය සෙනෙහසේ සලකුණකි. එබැවින්, බාප්දාදා මෙසේද පවසයි : ‘‘මගේ දරුවන් තුළ කිසිදු දුර්වලතාවයක් නොතිබිය යුතුය. සෑම කෙනෙකුම සම්පූර්ණ, පරිසමාප්ත සහ සමාන වේවා.’’ පරමාත්ම දෙවියන්ගේ මෙම සෙනෙහස ඔබ සියල්ලන්ම පහසු යෝගීන් බවට පත් කරවයි.